# ඕලන්ද ගෘහ නිර්මාණ සම්ප්‍රදාය පහතරට විහාරාරාම කෙරෙහි කළ බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්. එන්. සී. කොස්තා[1]

මෙරට ගෘහ නිර්මාණ සම්ප්‍රදාය අතර අද වන විට ඕලන්ද ගෘහ නිර්මාණ සම්ප්‍රදාය ද ප්‍රබල ගෘහ නිර්මාණ සම්ප්‍රදායයක් ලෙස ප්‍රකට වේ. විවිධ විද්වතුන් මේ පිළිබඳ ව පර්යේෂණ සිදු කිරීමට පෙලඹී ඇතත් ඕලන්ද ගෘහ නිර්මාණ සම්ප්‍රදායය, පහතරට විහාරයන්හි ගෘහ නිර්මාණ කෙරෙහි උපයෝගී කොටගත් බව දැක්වෙන කේවල අධ්‍යයනයක් මේ වන තෙක් සිදු කොට නොමැත. එහෙත් පහතරට විහාර චිත්‍ර කලාව යටත්විජිතකරණය නිසා ඇති වූ සාමාජික, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික විපර්යාස අනුව ඊට උචිත පරිදි සකස් වූ ආකාරය පිළිබඳ ව අවධාරණය කොට තිබේ. එහි දී ඕලන්ද සංස්කෘතික ලක්ෂණ මෙන් ම එහි ගෘහ නිර්මාණ ලක්ෂණ ද එයට එක් වී ඇති අයුරු දක්නට ලැබේ. එහෙයින් ලාංකේය ඕලන්ද ගෘහ නිර්මාණ සම්ප්‍රදායය පහතරට විහාරවලට කළ බලපෑම පිළිබඳ විමර්ශනයක් මෙයින් සිදු කිරීමට නියමිත ය. මේ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ලබාගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය කළ අතර ඒ සම්බන්ධ ප්‍රාමාණික විද්වතුන් සමඟ සම්මුඛ සාකච්ඡා සඳහා ද පවත්වන ලදි. එමෙන් ම ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ඉතිහාසය, වාස්තු විද්‍යාව හා පුරා විද්‍යාව සම්බන්ධ ග්‍රන්ථ ද, තෘතීයික මූලාශ්‍රය ලෙස වාර සඟරා, පුවත්පත්, අන්තර්ජාලය ආදිය ද පරිශීලනය කිරීම මඟින් දත්ත ඒකරාශී කරගැනීමට හැකියාව ලැබිණි. මෙසේ ගොනු කරගත් දත්ත ආශ්‍රයෙන් යටත්විජිත සමයයේ ව්‍යාප්ත වූ ඕලන්ද ගෘහ නිර්මාණ සම්ප්‍රදායේ ලක්ෂණ, විශේෂයෙන් ලංකාවේ පහතරට ප්‍රදේශයේ විහාරාරාමවල ගොඩනැගිලි ආශ්‍රයෙන් හමු වන බව අනාවරණය වේ. මෙසේ ඕලන්ද යුගයට පෙර හා පසු ව මෙරට පහතරට විහාර ගොඩනැගිලි කලාවේ ලක්ෂණ සංසන්දනය කර බලන කල්හි 'පහතරට විහාරාරාම ගොඩනැගිලි අංග ලක්ෂණ පූර්ව විහාර ගොඩනැගිලි අංග ලක්ෂණවලින් වෙනස් වන අයුරු පැහැදිලි වේ. මේ අනුව ඕලන්ද ගෘහ නිර්මාණ සම්ප්‍රදායය ලංකාවේ ව්‍යාප්ත වීමෙන් පහතරට ගෘහ නිර්මාණ සම්ප්‍රදායයට විශේෂ බලපෑමක් කර ඇති බව මේ පර්යේෂණයෙන් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** යටත්විජිතකරණය, පහතරට විහාර සම්ප්‍රදායය, විහාර ගොඩනැගිලි අංග, ඕලන්ද ගෘහ නිර්මාණ සම්ප්‍රදායය

---

[1] සිංහල අධ්‍යයනාංශය